
## ගජමුතුවක් රු.ලක්ෂ 63කට විකිණීමට තැත් කළ

# නීතිපති දෙපාර්තමේන්තුවේ සේවකයන් දෙදෙනෙක් දැලේ



● ජා-ඇල ප්‍රසංග පෙරේරා/ තිස්ස කොටින්කඩුව

කොළඹ - මීගමුව ප්‍රධාන මාර්ගයේ වැලිගම්පිටිය ප්‍රදේශයේ සුපිරි වෙළෙඳ සැලක් ඉදිරිපිටදී පෙරේදා (04දා) ගජමුතුවක් ළඟ තබාගෙන රුපියල් ලක්ෂ 63ක මුදලකට ව්‍යාපාරිකයෙකුට අලෙවි කිරීමට සූදානම් වී සිටි නීතිපති දෙපාර්තමේන්තුවේ සේවකයන් දෙදෙනෙකු අත්අඩංගුවට ගත් බව පොලීසිය පවසයි.

රත්නපුර සහ මහියංගණය යන ප්‍රදේශවල පදිංචි 29, 33 හැවිරිදි දෙදෙනෙක් මෙසේ අත්අඩංගුවට පත්ව සිටිති.

ඔවුන් නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය සහායකයන් ලෙස සේවය කරන්නන් බවට ප්‍රශ්න කිරීම් වලදී අනාවරණය වූ බව පොලීසිය පවසයි.

ජා-ඇල විශේෂ කාර්යාංශ උප ඒකකයේ නිලධාරීන් ලබා දුන් තොරතුරක් මත වැටලීම සිදු කර සැකකරුවන් අත්අඩංගුවට ගෙන තිබිණි.

ජා-ඇල පොලීසිය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.



## අධ්‍යාපනයේ ව්‍යුහාත්මක වෙනසක් මේ ජනාධිපති හෝ ආණ්ඩුව යටතේ සිදුකරන්න බෑ - පා.ම. ආචාර්ය හරිණි අමරසූරිය

## මේ ජනාධිපතිතුමා යටතේ ඒක සිදුවෙන්නේ නෑ කියලා හිතනවා නම් ඊළඟ මැතිවරණයේදී අපි ඒක විසඳගමු - උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ආචාර්ය සුරේන් රාඝවන්



● දිනේෂ් සමරකෝන්

අධ්‍යාපනයේ ව්‍යුහාත්මක වෙනසක් වර්තමාන ජනාධිපති හෝ ආණ්ඩුව යටතේ සිදුකළ නොහැකි බව ජාතික ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හරිණි අමරසූරිය මහත්මිය පැවසුවාය.

පාර්ලිමේන්තුවේදී ඊයේ (05දා) කාරක සභා අවස්ථාවේ විවාදයේදී අදහස් පළ කරමින් මන්ත්‍රීවරිය මේ බව සඳහන් කළාය.

කෙසේ වෙතත් වර්තමාන ජනාධිපතිවරයා යටතේ මෙම කාර්යය සිදුකිරීමට නොහැකි නම් ඊළඟ මැතිවරණයේදී එම ගැටලු විසඳ ගැනීමට කටයුතු කරන බවට ඊට ප්‍රතිචාර දක්වමින් උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ආචාර්ය සුරේන් රාගවන් මහතා පැවසීය.

**ජාතික ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හරිණී අමරසූරිය** - අද අපේ අධ්‍යාපන පද්ධතියේ තිබෙන විශාලතම ගැටලුව තමයි නිර්මාණය වෙමින් තියෙන අසමානතාව. විශ්වවිද්‍යාල අතර, ඩිසිප්ලින් අතර, පාසල් අතර, සෑම තැනින්ම තියෙන්නේ මේ අසමානතාව. අසමානතාව තවදුරටත් පවත්වාගෙන යන්න සමාජ සාධාරණය කියන එක සම්පූර්ණයෙන්ම බැහැර කරලා අධ්‍යාපනය ගැන අපට හිතන්න බෑ. සමාජ සාධාරණත්වය, සමානාත්මතාව තමයි අපේ අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළ තිබුණු වටිනාකම්. ඒවා තමයි අපි ආරක්ෂා කරගත යුත්තේ. ඒවා විකෘති කරන්න ඉඩ දෙන්න බෑ. ඇත්ත වශයෙන්ම මොනවා කතා කළත් අපට නම් හිතෙන්නේ මේ ආණ්ඩුවට මේක කරන්න බෑ.

මේ අධ්‍යාපනයට අද දවසේ අවශ්‍ය වෙන්නේ මතුපිටින් එන අරකට විසඳුමක්, මේකට විසඳුමක් කියන එක නෙවෙයි. අපට මේකේ ව්‍යුහාත්මක වෙනසක් අවශ්‍යයි. දර්ශනයේ වෙනසක් අවශ්‍යයි. මේක දිගා බලන විදිහේ වෙනසක් අවශ්‍යයි. ඒක කරන්න මේ ආණ්ඩුවට හැකියාවක් නෑ කියන එක තමයි අපි විශ්වාස කරන්නේ. රාජ්‍ය ඇමතිතුමාටත්, කැබිනට් ඇමතිතුමාටත් අවශ්‍යතාව තියෙන්න පුළුවන්. මේ ආණ්ඩුව තුළ, මේ ජනාධිපති යටතේ ඔබ හිතන කිසිදෙයක් වෙන්නේ නෑ. ඒ නිසා මේ රටට අවශ්‍ය අධ්‍යාපන ප්‍රතිපත්තියක් හරියට ක්‍රියාත්මක වෙන්න මේ ආණ්ඩුව ගැන කිසිදු බලාපොරොත්තුවක් නෑ.

**උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ආචාර්ය සුරේන් රාඝවන්** - බඩගින්නේ පාසල් ගිහින් අධ්‍යාපනය විතරක් මගේ ආයෝජනය කර ගත්ත එකම පුද්ගලයෙක් විදියට මම මෙතන හිට ගන්නේ. කලා අධ්‍යාපනය, කලා උසස් අධ්‍යාපනය, මානව ක්ෂේත්‍ර අධ්‍යාපනය කියන කිසිදු වෙනසක් නොකර, ඒ උපාධි හතරම යාවත්කාලීන කරන්න ප්‍රථම වරට මේ රටේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පියවර ගෙන තිබෙනවා. ඔබතුමිය හිතනවා නම් මේ ජනාධිපතිතුමා යටතේ ඒක සිදුවෙන්නේ නෑ කියලා, අපි ඊළඟ මැතිවරණයේදී අපි ඒක විසඳගමු.

## විදුලි බිල වැඩි කිරීමෙන් ඇති වූ ආර්ථික ගැටලු විසඳීමේ උත්සාහයක්

### - ආර්ථික අර්බුදයේ බලපෑම් සමනය කිරීම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට ම.උ.කො. කැඳවයි

● ඉන්දික හේවාවිතාරණ

විදුලි බිල වැඩි කිරීම නිසා ආර්ථිකයට බලපා තිබෙන ගැටලු විසඳීමට අදාළ ඉදිරි සැලසුම් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ආර්ථික අර්බුදයේ බලපෑම් සමනය කිරීම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට හෙට (07දා) මහජන උපයෝගිතා කොමිසමේ බලධාරීන් කැඳවා තිබේ.

මේ අනුව එම ආයතනයේ සභාපතිවරයා, අධ්‍යක්ෂ ජනරාල්වරයා හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් අදාළ කාරක සභාවට කැඳවා තිබෙන අතර මෙම රැස්වීම හෙට උදේ 10.00ට පාර්ලිමේන්තු කාරක සභා කාමර අංක 06දී පැවැත්වීමට නියමිතව ඇත.

විදුලි බිල වැඩි වීම හේතුවෙන් ආර්ථික අර්බුදය වඩාත් තීව්‍ර වී තිබෙන බවට නිරීක්ෂණය වී තිබෙන නිසා ආර්ථික අර්බුදය විසඳ ගැනීමට මහජන උපයෝගිතා කොමිසමේ කාර්යභාරය හා වගකීම් හා ඉදිරි සැලසුම් මෙහිදී සාකච්ඡා කිරීමට නියමිතව තිබේ.

## බේරේ වැවේ ප්‍රගතිය හා ඉදිරි සැලසුම් 15දාට පෙර ජනපතිට ලබාදෙන්න

### - ජනාධිපති කාර්යමණ්ඩල ප්‍රධානී සාගල රත්නායකගෙන් ආයතන ප්‍රධානීන්ට උපදෙස්

● නවෝද්‍යා පවනි

බේරේ වැව සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රගතිය හා ඉදිරි සැලසුම් සම්බන්ධයෙන් සකස් කළ වාර්තා දෙසැම්බර් 15 දිනට පෙර ජනාධිපතිවරයා වෙත ලබා දෙන ලෙස ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක හා ජනාධිපති කාර්යමණ්ඩල ප්‍රධානි සාගල රත්නායක මහතා විසින් අදාළ ආයතන ප්‍රධානීන්ට උපදෙස් දී තිබේ.

එසේම කොළඹ නගර අලංකරණ සැලැස්ම හා එහි වර්තමාන ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ද ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා කඩිනමින් ලබා දෙන ලෙස සාගල රත්නායක මහතා අදාළ ආයතන ප්‍රධානීන්ට වැඩිදුරටත් දැනුම් දුන්නේය.

සාගල රත්නායක මහතා මෙම උපදෙස් ලබා දුන්නේ කොළඹ නගර අලංකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා බේරේ වැව සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචනය වෙනුවෙන් ජනාධිපති කාර්යාලයේ පැවති සාකච්ඡාවේදීය.

බේරේ වැව ආශ්‍රිත මහජන ක්‍රියාකාරකම් සඳහා සංවර්ධනය කර භාවිත කළ හැකි හඳුනාගත් ඉඩම් කොටස් පෞද්ගලික අංශයේද සහභාගිත්වයෙන් සංවර්ධනය කිරීම මෙන්ම බේරේ වැවට හරවන ලද මළ අපද්‍රව්‍ය නළ මාර්ග වළක්වාලීම සහ වැවේ බැක්ටීරියා හා ඇල්ගී ප්‍රතිශතය අවම කිරීමේ ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය ද මෙහිදී විමසා බැලීම සිදුකර ඇත.

මේ වන විට ස්ථාන 03ක පිහිටි මධ්‍යම බස් නැවතුම්පොළ, කොටුව දුම්රිය ස්ථානයට යාබදව ස්ථානගත කර දැනට බස් නැවතුම්පොළ පිහිටි ඉඩම් වාණිජමය කටයුතු සඳහා පෞද්ගලික අංශය සමග එක්ව සංවර්ධනය කිරීම, කොළඹ නගරයේ පිහිටි අනාරක්ෂිත ගස් ඉවත් කර ඒ වෙනුවට සුදුසු ගස් වර්ග නැවත සිටුවීම, කොළඹ නගරයේ අත්හැර දමන ලද වල් බිහිවී ඇති ගොඩනැගිලි හඳුනාගෙන ඒවා නඩත්තු කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සැකසීම, කොළඹ නගරයේ රථ වාහන ධාවනය, මගීන් නංවාගැනීම හා නතර කිරීම සම්බන්ධව නියාමන සැලැස්මක් සැකසීම, වැසි ජලය බැසයාම ක්‍රමවත් කිරීම සඳහා දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල ප්‍රගතිය සම්බන්ධයෙන් ද මෙහිදී දීර්ඝ ලෙස සාකච්ඡා කර ඇත.

## 14 හැවිරිදි දැරියක අපයෝජනය කළැයි 24 හැවිරිදි චීවරධාරියෙක් අත්අඩංගුවට

● බණ්ඩාරගම - බිමල් ශ්‍යාමන් ජයසිංහ

මවුපියන්ගේ අනුදැනුම මත 14 හැවිරිදි දැරියක අපයෝජනය කිරීම සම්බන්ධයෙන් කළුතර ප්‍රදේශයේ විහාරස්ථානයක වැඩ වාසය කරන 24 හැවිරිදි චීවරධාරියෙකු අත්අඩංගුවට ගත් බව කළුතර කොට්ඨාස ළමා හා කාන්තා කාර්යාංශය සඳහන් කරයි.

එම ස්ත්‍රී දූෂණයට ආධාර අනුබලදීම සම්බන්ධයෙන් එම දැරියගේ මව සහ පියා ද අත්අඩංගුවට ගත් බව එම කාර්යාංශය පවසයි.

සිද්ධියට මුහුණදුන් දැරිය රෝහල්ගත කර ඇත.

කළුතර ළමා හා කාන්තා කාර්යාංශයේ ලද තොරතුරක් අනුව දැරිය පොලීසියට කැඳවා ලබාගත් ප්‍රකාශයක් අනුව සැකකරුවන් අත්අඩංගුවට ගත් බව උසස් පොලිස් නිලධාරියෙක් පැවැසීය.

වින්දිත දැරියගේ මව අවුරුදු 34ක් වන අතර පියා අවුරුදු 43කි.

සැකකරුවන් දෙදෙනා සහ සැකකාරිය කළුතර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

කළුතර කොට්ඨාස ළමා කාන්තා කාර්යාංශය සිද්ධිය පිළිබඳ වැඩිදුර විමර්ශන සිදු කරයි.

## නිවසේදී මියගිය සිසුවිය සම්බන්ධයෙන් පරීක්ෂණ

● පානදුර - සුමිත් පොතුපිටිය

සිය නිවසේදී 14 හැවිරිදි පාසල් සිසුවියක මියගොස් ඇති බවට ලද පැමිණිල්ලක් මත කළුතර දකුණ පොලීසිය පරීක්ෂණ ආරම්භ කර තිබේ.

කළුතර, බොලොස්සගම ප්‍රදේශයේ පදිංචිව සිටි කේ.ආර්. තරින්දි මධුසිකා නමැත්තියක මෙසේ මියගොස් ඇතැයි පොලීසිය කීය.

ඇය පෙරේදා (04දා) පස්වරුවේ නිවසේ වහලයේ එල්ලී සිටිනු ඇගේ සහෝදරයා දැකීමෙන් පසු ඇය වහා කළුතර ශික්ෂණ රෝහලට ඇතුළත් කර ඇති බව පොලීසිය පවසන අතර, ඒ වනවිටත් ඇය මියගොස් සිට ඇති බව රෝහල් ආරංචි මාර්ග සඳහන් කරයි.

කළුතර මූලස්ථාන පොලීසිය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

## පැමිණිල්ලක් ගැන විමර්ශනයක් නොකළැයි නාරම්මල Crime OIC හා SIගේ සේවය අත්හිටුවයි

● කුලියාපිටිය - දිනේෂ් උපේන්ද්‍ර/ කුරුණෑගල - ජනූර් කිච්ලාන්

නාරම්මල පොලිසියේ සේවයේ නියුතුව සිටි නිලධාරීන් දෙදෙනෙකුගේ සේවය පෙරේදා (04දා) සිට වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවීමට කුලියාපිටිය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා නියෝග කර ඇත.

නාරම්මල පොලිසියට අනුයුක්තව සේවය කළ අපරාධ විමර්ශන ඒකකයේ ස්ථානාධිපතිවරයාගේ හා එම අංශයටම අනුයුක්තව සේවයේ නිරතව සිටි උපපොලිස් පරීක්ෂකවරයෙකුගේ සේවය මෙසේ අත්හිටුවීමට පියවර ගනු ලැබ තිබේ.

ඉකුත් නොවැම්බර් 30වැනිදා නාරම්මල - මීගමුව පාරේ පිහිටි ව්‍යාපාරික ස්ථානයක් බිඳ එහි තිබූ දේපොළ සොරාගැනීමක් ඇතුළු සිදුව ඇතැයි කියන සිද්ධියක් සම්බන්ධව පැමිණිලි ලැබ තිබුණද එම පැමිණිලි සම්බන්ධයෙන් නිසි විමර්ශනයක් සිදු නොකිරීම හේතුවෙන් පොලිස් නිලධාරීන්ගේ සේවය අත්හිටුවීමට පොලිස් අධිකාරිවරයා කටයුතු කර ඇති බවද වාර්තා වේ.

## පෑලියගොඩ මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණයේ සභාපතිවරයාට මරණීය තර්ජනය කළ 3ක් මත් කුඩු සමග දැලේ

● බණ්ඩාරගම - බිමල් ශ්‍යාමන් ජයසිංහ

පෑලියගොඩ මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණයේ සභාපතිවරයාට දුරකථනයෙන් මරණීය තර්ජනය කරමින් රුපියල් ලක්ෂ 10ක කප්පම් මුදල් ඉල්ලූ බව කියන 'මල්වත්තේ අමිල' නමැත්තා ඇතුළු තිදෙනෙක් මත්ද්‍රව්‍ය සමග අත්අඩංගුවට ගත් බව කොළඹ අපරාධ කොට්ඨාසය සඳහන් කරයි.

සැකකරුවන් සන්තකයේ තිබී හෙරොයින් ග්‍රෑම් 22 මිලිග්‍රෑම් 970, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 940ක් හා කප්පම් ඉල්ලීමට යොදාගත් ස්මාර්ට් වර්ගයේ ජංගම දුරකථනය ද පොලිස් භාරයට ගෙන ඇත.

පෑලියගොඩ මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ සභාපතිවරයා කොළඹ අපරාධ කොට්ඨාසයේ සංවිධානාත්මක අපරාධ විමර්ශන ඒකකයට කරන ලද පැමිණිල්ලක් අනුව පරීක්ෂණ පවත්වා සැකකරුවන් අත්අඩංගුවට ගෙන තිබිණි.

නාරාහේන්පිට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලය ඉදිරිපිට දී සැකකටයුතු පුද්ගලයන් දෙදෙනෙකු භාරයට ගෙන පරීක්ෂාවට ලක් කිරීමේදී මල්වත්තේ අමිල නමැත්තා සන්තකයේ තිබී හෙරොයින් මත්කුඩු පාර්සලයක් සොයා ගැනීමට හැකි වූ බව පොලීසිය සඳහන් කරයි.

එම සැකකරු සමඟ සිටි අනෙක් පුද්ගලයා හෙරොයින් මත්කුඩු ජාවාරමට අත්අඩංගුවට ගත් බවත් කප්පම් ගැනීමේ සිද්ධියට සම්බන්ධ අනෙක් සැකකරු අයිස් මත්ද්‍රව්‍ය සමග සේදවත්ත ඉන්ධන පිරවුම්හල අසලදී අත්අඩංගුවට ගැනීමට හැකි වූ බව පොලිස් නිලධාරියෙක් පැවැසීය.

සැකකරුවන් සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයේදී පෑලියගොඩ මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණයේ සභාපතිවරයාගෙන් කප්පම් මුදල් ඉල්ලා ඇත්තේ ගම්පොළ අමිත් නොහොත් දසුන් නමැත්තකු බවත් අමිත් යන අය විසින් තුන්වැනි සැකකරුගේ ජංගම දුරකථනයට ඇමතුමක් ලබා ගැනීමෙන් පසු දුරකථන සංවාදයට මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණයේ සභාපතිවරයා (කොම්පරන්ස් කෝල් මගින්) සම්බන්ධ කරගෙන අමිත් යන අය විසින් කප්පම් ඉල්ලා ඇතැයි පොලිස් විමර්ශනවලදී අනාවරණය වී ඇත.

කප්පම් ඉල්ලීම මල්වත්තේ අමිල නමැත්තාගේ අනුදැනුම මත සිදුවී ඇති බවට වැඩිදුරටත් අනාවරණය වී යැයි පොලිස් නිලධාරියා වැඩිදුරටත් පැවසීය.

කප්පම් ඉල්ලීමට යොදාගත් ජංගම දුරකථනය හා සිම් පත පෑලියගොඩ නුවර පාර මල්වත්ත ප්‍රදේශයේ නිවසක සඟවා තිබියදී පොලීසිය මගින් සොයා ගනු ලැබ තිබේ.

කොළඹ අපරාධ කොට්ඨාසය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

### මහා මාර්ගවල හා නිවාසවල නවතා තබා යන

## යතුරුපැදි සොරාගත් අයෙක් අත්අඩංගුවට

● දෙහිවල - එච්.එම්.ධර්මපාල

දෙහිවල පොලිස් වසමේ මහා මාර්ගවල හා නිවාසවල නවතා තබා යන යතුරුපැදි සොරාගත් බවට සැකකරන පුද්ගලයෙකු දෙහිවල පොලීසිය විසින් අත්අඩංගුවට ගනු ලැබ තිබේ.

වස්කඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු මෙසේ අත්අඩංගුවට ගෙන ඇත.

මොහු විසින් සොරා ගන්නා ලද බවට සැකකරන රුපියල් ලක්ෂ විසි දෙකක් පමණ වටිනා යතුරුපැදි තුනක් හා මොහු සතුව තිබූ රුපියල් ලක්ෂයකට අධික වටිනා හෙරොයින් තොගයක්ද පොලිස් භාරයට ගනු ලැබ තිබේ.


දැනට වසර 15ක පමණ සිට දෙහිවල ඕබන් පෙදෙස තම සොයුරියගේ නිවසේ පදිංචිව සිටිමින් කුලී වැඩ කරන බවට අනාවරණය වී තිබේ.

සැකකරුගේ මස්සිනාද හෙරොයින් භාවිතයට හුරුවී ඇති බවත් සැකකරුද හෙරොයින් පානයට හුරුවී ඒ සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීමට මෙලෙස නිවාස බිඳ හා යතුරුපැදි සොරකමේ නියුතුව සිටින බවට හෙළි වී ඇතැයිද පොලීසිය පැවසීය.

සැකකරු මීට පෙරත් සොරකම් ගණනාවක් සිදු කර ඇති බවත් දැනට අධිකරණයේ නඩු දෙකක් විභාග වෙමින් පවතින බවත් පොලීසිය කියයි. දෙහිවල පොලීසිය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

## බෙලිහුල්ඔය ආශ්‍රිතව කඳු තරණය ඇතුළු භාවනානුයෝගී වැඩසටහන් ඇතුළත් සංචාරක ව්‍යාපෘතියක්

● රත්නපුර - ලසන්ත නිරෝෂණ පෙරේරා



මෙරට ආකර්ෂණීය පරිසර පද්ධතියක් සහිත බෙලිහුල්ඔය ආශ්‍රිත කලාපය ගැමි චාරිකා, කඳු තරණය ඇතුළු අංග සමග දේශීය සංස්කෘතියට මුල්තැන දෙමින් භාවනානුයෝගී වැඩසටහන් ඇතුළත් සංචාරක පරාදීසයක් ලෙස සංවර්ධනය කිරීමේ වැඩසටහනක් ආරම්භ වී තිබේ.

නිහඬ සංචාරක කලාපයක් ලෙස සොබාදහම රසවිඳින, ගවේෂණය කරන දෙස් විදෙස් සංචාරකයන් අතර බෙලිහුල්ඔය ලංකාවේ වෙනස් සංචාරක පාරාදීසයක් බවට පත්කිරීම තම අරමුණ බව බෙලිහුල්ඔය සංචාරක හෝටල් හිමියන්ගේ සංගමය පවසයි.

දැනට වසර කිපයක සිට බෙලිහුල්ඔය සංචාරක හෝටල් හිමියන්ගේ සංගමයේ මෙම අරමුණ පෙරදැරිව සංචාරක ප්‍රවර්ධනය ආරම්භ කර ඇතැයි එහි භාණ්ඩාගාරික ගැහැම් ඩියුක් මහතා පැවසීය.

බෙලිහුල්ඔය සංචාරක හෝටල් හිමියන්ගේ සංගමයේ සභාපති සුදත් ජයවර්ධන සහ ලේකම් ධනුෂ් ඇල්ලේගෙදර යන මහත්වරුන් සඳහන් කළේ රජයේ සහයෝගයද බෙලිහුල්ඔය සංචාරක ප්‍රවර්ධනයට ලැබෙන බවයි. සමනලවැව ජලාශය ඉදිකිරීමේදී සකසන ලද උමං පද්ධති විශේෂ ආරක්ෂණ ක්‍රමවේදයක් යටතේ දේශීය හා විදේශීය සංචාරකයන්ට නැරඹුම් ස්ථාන ලෙස සංවර්ධනය කිරීමට රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව බෙලිහුල්ඔය සංචරණය වැඩසටහන අනුව සැලසුම් කර තිබේ.

සමනල වැව ජලාශයේ ජල ක්‍රීඩා හා බෝට්ටු සවාරි සූදානම් කිරීම, සමනල වැව බැම්මට පහළ ස්ථානය දිය නාන ස්ථානයක් ලෙස සකස් කරමින් "බෙලිහුල්ඔය" රත්නපුර දිස්ත්‍රික්කයේ පවත්නා සංචාරක ආකර්ෂණීය ස්ථාණයක් බවට පත්කිරීමට සැලසුම් කරන බව සමනලවැව ජලාශයේ නිරීක්ෂණ චාරිකාවකට එක්වෙමින් රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මහතා පසුගියදා පැවසීය.

බෙලිහුල්ඔය ප්‍රදේශය පාරිසරිකව සංචාරක කලාපයක් ලෙස ප්‍රකටව ඇතත් කිංචිගුණේ ප්‍රාග් ඓතිහාසික යකඩ උදුන් පද්ධතිය, කූරගල, දූවිලි ඇල්ල, කල්තොට, බුදුගල, නන්පේරියල්, පහන්තුඩාව, උඩවලව වනෝද්‍යානයේ හඳගිරිය පිවිසුම වැනි ස්ථාන සංවර්ධනය කර සංචාරක කලාපයක් ලෙස සංවර්ධනය කිරීමටත් දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණය වන ලෙස ප්‍රවර්ධනය කිරීමට තීරණය විය.

විශේෂයෙන් මෙම ස්ථාන තිරසර ලෙස සංවර්ධනය කිරීමෙන් බෙලිහුල්ඔය ප්‍රදේශයේ සංචාරය කරන දෙස් විදෙස් සංචාරකයන් එක් දිනකට වඩා වැඩි දින ගණනක් මෙම ප්‍රදේශයේ නවතා ගැනීමට හැකිවන ලෙස සැලසුම් සකස් කිරීමටද අවධානය යොමුව තිබේ.

## මත්පැන් සාදයක් අතරතුර ඇති වූ ගැටුමකින් තුවාල ලැබූ අයෙක් පිහිණුම් තටාකයට ඇද දැමීමෙන් මරුට

● ජාඇල - තිස්ස කොටින්කඩුව/ ප්‍රසංග පෙරේරා

ජා-ඇල පොලිස් වසමේ දඬුගම උදම්විට ප්‍රදේශයේ සුපිරි හෝටලයක මත්පැන් පානය කරමින් සතුටු වූ මිතුරන් පිරිසක් අතර ඇති වූ බහින් බස්වීමක් දුරදිග යාමෙන් පෙරේදා (04දා) සවස ඇති වූ ගැටුමකින් 34 හැවිරිදි පුද්ගලයෙකු හෝටලයේ පිහිණුම් තටාකයට වැටී මියගොස් ඇතැය ජා-ඇල පොලීසිය පවසයි.

ජා-ඇල, තුන්පෑලිය කුරුසවල පාරේ පදිංචි ධනුක සම්පත් සිල්වා (34) නමැත්තෙකු මෙසේ ජීවිතක්ෂයට පත්ව ඇත.

හෙතෙම ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කොන්ත්‍රාත් කරුවෙකු ලෙස කටයුතු කර ඇති බවට අනාවරණය වී ඇතැයි පොලීසිය පවසයි.

සිද්ධිය සම්බන්ධයෙන් මේ වනවිට ජා-ඇල සහ පමුණුගම ප්‍රදේශයේ පදිංචි තරුණයන් පස්දෙනෙකු සැකපිට අත්අඩංගුවට ගෙන ඇත. සැකකරුවන් අතර මියගොස් ඇති අයගේ ඥාතීන්ද සිටින බව පොලීසිය පවසයි.

ගැටුමට මුල්වූ පිරිස එකට එක්ව එම හෝටලයේදී මත්පැන් පානය කරමින් විනෝදව සිට ඇති අතර තුර මෙම ගැටුම සිදුව ඇති පොලීසිය සඳහන් කරයි. මෙම අවස්ථාවේ තදින් මත්ව සිටි පිරිසේ කිහිපදෙනෙකු පහර කෑමට ලක්ව සිටි මරණකරු අල්ලා හෝටලයේ පිහිණුම් තාටකයට විසි කොට ඇති බවත් පොලිස් විමර්ශන කටයුතුවලදී හෙළි වූ බව පොලීසිය සඳහන් කරයි.

පසුව හෝටල් සේවකයන් විසින් නාන තටාකයේ ගිලී සිටි පුද්ගලයා ගොඩට පොලිස් හදිසි ඇමතුම් ඒකකයට කතාකොට මීගමුව මහ රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇති බව පොලීසිය වැඩිදුරටත් සඳහන් කරයි.

ජා-ඇල පොලීසිය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

